Australian Government
Department of Home Affairs

# කෝවිඩ්-19 පරීක්‍ෂා කිරීම සහ ප්‍රතිකාර

ඔබට වීසා බලපත්‍රයක් නැති වුවද, නැතිනම් ඔබගේ වීසා බලපත්‍ර තත්වය සම්බන්ධයෙන් පැහැදිලි නැතිවුවද, ඔබ විසින් මහජන සෞඛ්‍යය විධාන අනුගමනය කල යුතුය. ඔබට අසනීප නම්, වෛද්‍ය උපදෙස් ලබා කෝවිඩ්-19 සම්බන්ධයෙන් පරීක්‍ෂා කර ගන්න.

ප්‍රාන්ත සහ ටෙරිටරි රජයන් මගින් කෝවිඩ්-19 සම්බන්ධයෙන් පරීක්‍ෂා කිරීම සහ ප්‍රතිකාර ලබාදීම සිදු කෙරේ.

- ඕස්ට්‍රේලියන් කැපිටල් ටෙරිටරි
- නිව් සවුත් වේල්ස්
- නොදර්න් ටෙරිටරි
- ක්වීන්ස්ලන්ඩ්
- සවුත් ඕස්ට්‍රේලියා
- තස්මේනියා
- වික්ටෝරියා
- වෙස්ටර්න් ඕස්ට්‍රේලියා

### වික්ටෝරියා ප්‍රාන්තයේ සංක්‍රමණ සෞඛ්‍යය පරීක්‍ෂණ

තවදුරටත් ඇති කෝවිඩ්-19 සීමා හේතුවෙන්, වික්ටෝරියා ප්‍රාන්තයේ සියළුම සංක්‍රමණ වෛද්‍ය පරීක්‍ෂණ තාවකාලිකව නවත්වා ඇත. වැඩිදුර මහජන සෞඛ්‍යය නිවේදනයන්ට අනුකූලව මෙම තීරණය සමලෝචනය කරනු ඇත.

# මා හට නිවාඩු ගතකරන අතර වැඩ කිරීම සඳහා වීසා බලපත්‍රයක් (Working Holiday Maker visa) ඇත

නිවාඩු ගතකරන අතර වැඩ කරන වීසා බලපත්‍රයක් (Working Holiday Maker (WHM)) දීර්ඝ කල නොහැක. කෙසේවුවද, ඔබ ඕස්ට්‍රේලියාවේ 'නියමිත වැඩ' මාස තුනක් හෝ හයක් සම්පූර්ණ කර ඇතිනම්, ඔබ හට දෙවන හෝ තෙවන WHM වීසා බලපත්‍රයකට අයදුම් කිරීම කල හැකිය.

වැඩි විස්තර සඳහා  නියමිත වැඩ කොන්දේසි බලන්න.

සෞඛ්‍යය රැකවරණ සහ වෛද්‍ය ක්ෂේත්‍රවල 2020 ජනවාරි 31 දිනට පසු වැඩ කරන නිවාඩු ගතකරන අතර වැඩ කරන වීසා බලපත්‍රධාරීන් (WHM) හට සිය 2 වන WHM සහ 3 වන WHM වීසා බලපත්‍රයට අයදුම් කිරීම සඳහා 'නියමිත වැඩ' වශයෙන් මෙම කාලය සලකා බැලිය හැකිවේ. වැඩිදුර විස්තර සඳහා [නවතම පුවත්] බලන්න.

ඔබ දෙවෙනි හෝ තෙවෙනි වීසා බලපත්‍රයකට අයදුම් කිරීමට සුදුසුකම් නොලබන අතර කෝවිඩ්-19 සඳහාවූ තීරණාත්මක ක්ෂේත්‍රයක වැඩ නොකරයි නම්, ඔබ විසින් වෙනත් වීසා බලපත්‍රයකට අයදුම් කල යුතුය. මේ මගින් ඔබ නැවත සිය මව්බිමට යන තෙක් ඕස්ට්‍රේලියාවේ නීත්‍යානුකූලව රැඳී සිටීමට ඉඩකඩ ලබාදේ. කෝවිඩ්-19 සඳහා තීරණාත්මක ක්ෂේත්‍ර වන්නේ කෘෂිකර්මාන්තය, ආහාර සැකසීම, සෞඛ්‍යය, වයෝවෘද්ධ සහ ළමා රැකවරණ ක්ෂේත්‍රයන්ය.

ඔබගේ අවස්ථානුකූල තත්වයන් අනුව, ඔබට [සංචාරක වීසා බලපත්‍ර (උපකාණ්ඩ 600)] සඳහා අයදුම් කිරීමට සුදුසුකම් තිබිය හැකිය.

නව වීසා බලපත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා වයස් සීමා, ඉංග්‍රීසි භාෂාව, සෞඛ්‍යය සහ චරිත අවශ්‍යතා ඇතුළු එම වීසා බලපත්‍රයේ අවශ්‍යතා සපුරාලිය යුතුය.

## දෙවෙනි හෝ තෙවෙනි WHM වීසා බලපත්‍රයකට අයදුම් කිරීම

ඔබ හට දෙවෙනි හෝ තෙවෙනි Working Holiday (subclass 417) හෝ Work and Holiday (subclass 462) වීසා බලපත්‍රයකට අයදුම් කිරීමට සුදුසුකම් තිබිය හැකිය. ඔබට සුදුසුකම් ඇතිද යන්න සහ අයදුම් කරන ආකාරය දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් සොයා දැන ගන්න:

- Second Working Holiday (subclass 417) visa
- Third Working Holiday (subclass 417) visa
- Second Work and Holiday (subclass 462) visa
- Third Work and Holiday (subclass 462) visa

ඔබගේ වර්තමාන වීසා බලපත්‍රය අවසානවීමට පෙර නව වීසා බලපත්‍රයකට අයදුම් කල යුතුය. ඔබගේ වීසා අයදුම්පත්‍රය සම්බන්ධ තීරණයක් ගන්නා තෙක් ඔබව ඕස්ට්‍රේලියාවේ නීත්‍යානුකූලව තබා ගැනීම සඳහා ඔබට බ්‍රිජිං වීසා බලපත්‍රයක් ප්‍රදානය කල හැකිය.

### 8547 වීසා කොන්දේසිය - එක් සේවායෝජකයෙකු සමඟින් මාස හයක් වැඩකලහැකි බවට වූ සීමාව

නිවාඩු ගතකරන අතර වැඩ කරන වීසා බලපත්‍රයක් ඇති අය හට ඔවුන් ඕස්ට්‍රේලියාවේ සිටින අතරතුර ඕනෑම වැඩක නිරත විය හැකිය. දෙපාර්තමේන්තුව මගින් [එක් සේවායෝජකයෙකු සමඟ වැඩකරන කාලය මාස හයකට] වඩා කිරීමට අනුමැතිය දී ඇතිනම් මිස සාමාන්‍යයෙන් එක් සේවායෝජකයෙකු සමඟ වැඩකල හැකි කාලය මාස හයකි.

නිවාඩු ගතකරන අතර වැඩ කරන වීසා බලපත්‍රයක් ඇති සෞඛ්‍යය, වයෝවෘද්ධ සහ කෘෂිකර්මාන්තය, ආබාධිත රැකවරණ වැනි තීරණාත්මක අංශවල වැඩ කරන අය හට

විශේෂ, කලින් නොදුටු තත්වයන් යටතේ එක් සේවායෝජකයෙකු සමඟ මාස හයකට වඩා වැඩි කාලයක් වැඩ කිරීමට දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලබාදී ඇත.

## මම තීරණාත්මක ක්ෂේත්රයක වැඩ කරමි

නිවාඩු ගතකරන අතර වැඩ කරන වීසා බලපත්‍ර ඇති අය (WHMs) විසින් 2020 ජනවාරි 31 දිනට පසු ඕස්ට්‍රේලියාවේ ඕනෑම ස්ථානයක සෞඛ්‍යය රැකවරණ සහ වෛද්‍ය ක්ෂේත්‍රයන්හි කරන ලද කෝවිඩ්-19 තීරණාත්මක රාජකාරි, නියම කරන ලද රාජකාරි බැවින්, දෙවෙනි හෝ තෙවෙනි WHM වීසා බලපත්‍රයකට අයදුම් කිරීම සඳහා ගණනය කල හැකිය. වැඩිදුර විස්තර සඳහා නවතම පුවත් බලන්න.

දෙවෙනි හෝ තෙවෙනි වීසා බලපත්‍රයකට සුදුසුකම් නැති මෙම තීරණාත්මක ක්ෂේත්‍රවල වැඩ කරන, වැඩ කරන අතර නිවාඩු ගතකරන වීසා බලපත්‍රධාරීන් හට සිය මව්බිමට යාමට නොහැකි නම්, Temporary Activity Visa (subclass 408) Australian Government Endorsed Agreement Event stream (COVID-19 Pandemic event visa) වීසා බලපත්‍රයකට අයදුම් කිරීමට සුදුසුකම් ලැබේ. අයදුම්පත්‍ර ගාස්තුවක් නැත.

මෙම වීසා බලපත්‍රය මගින් ඔබට සිය මව්බිමට යාමට හැකිවන තෙක් ඕස්ට්‍රේලියාවේ රැඳී සිටීමට සහ දිගටම වැඩ කිරීමට අවසර ලබාදේ.

වැඩිදුර විස්තර සඳහා නියමිත වැඩ කොන්දේසි බලන්න.

## මූල්‍ය දුෂ්කරතා අත්දකින වීසා බලපත්රධාරීන්

ඔබගේ කටයුතු කරගෙන සිටිය නොහැකි නම්, සිය මව්බිම කරා යාමට කටයුතු පිළියෙල කරගත යුතුය.

ඔබගේ වැඩ තාවකාලිකව නවත්වා ඇති නමුදු සේවය අවසන් කර නැතිනම් සහ ඔබගේ ජීවන වියදම උපයාගත නොහැකිනම්, 2019-20 මූල්‍ය වර්ෂයේදී බදුවලට යටත් නොවී $10,000 දක්වාවූ මුදලක් විශ්රාම පාරිතෝෂික මුදලින් ලබාගත හැකිය.

කරුණාකර විශ්රාම පාරිතෝෂික සඳහා කලින් ප්රවේශවීම සම්බන්ධ ඕස්ට්රේලියානු බදු කාර්යාල වෙබ් පිටුව බලන්න.

## කෝවිඩ්-19 පැන්ඩමික් ඉසව් වීසා බලපත්රය (COVID-19 Pandemic event visa)

ඔබගේ සංචාරක වීසා බලපත්රය අවසානයට පත්වේ නම්, සහ ඔබ තීරණාත්මක ක්ෂේත්රයක වැඩ නොකරයි නම් සහ ඔබට නැවත මව්බිමට යාමට නොහැකිනම්, සහ වෙනත් වීසා බලපත්රයකට අයදුම් කිරීමට සුදුසුකම් නොමැතිනම්, ඔබ විසින් COVID-19 Pandemic event visa බලපත්රයකට අයදුම් කිරීමට සුදුසුකම් තිබිය හැකිය. ඔබ විසින් සංචාරක වීසා බලපත්රයක් ඇතුළුව වෙනත් වීසා බලපත්රයකට අයදුම් කිරීමට සුදුසුකම් නැති බව තහවුරු කල යුතුය. මේ අතරට වෙනත් වීසා අයදුම් පත්රයකට අයදුම් කිරීම සඳහා මුදල් නොමැති බව සඳහන් ප්රකාශයක් ඇතුලත් කල හැකිය.